## 206 පූජනීය ප්‍රේමයයි

පූජනීය ප්‍රේමයයි ඔබේ සමිඳුනේ
මගේ සදා විමුක්තියේ හිරු උදා කළේ //

දයා ගුණේ ඔබේ හදේ පිරීතිරී
ළයේ තුවාලයෙන් ගලා හැලේ නිරන්තරේ
එදා සුවේ ලැබූ නෙතේ කතන්දරේ
මැවේ මගේ නුවන් තිරේ ම ජේසු ස්වාමිනේ

ඔබේ මුවින් දෙසූ වදන් අමා රසේ
මගේ සවන් දොරින් උරා ගතිමි උදේ හවා
එවන් දහම් බෙලෙන් කෙලෙස් මලින් මිදී
ඔබේ සනාදෙරෙන් නිවී ගෙවමි මගේ දිවී

එදා සමාරියේ ළිඳක් සමීපයේ
ළඳක් ඔබෙන් පැතූ ලෙසින් මමත් පතන්නෙමී
පිපාසයෙන් මෙහි තැවී සිටින්නෙමී
මටත් පොවන්නැ ජේසුනි ඒ ජීවනේ ජලේ